රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.

இணைந்த சேவைகள் பிரிவு
சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை.

**COMBINED SERVICES DIVISION**
Independence Square, Colombo 07, Sri Lanka

| | | | |
|---|---|---|---|
| දුරකතන<br>தொலைபேசி:**(94) 011- 2694560**<br>Telephone | ෆැක්ස්<br>தொலைநகல்:**(94) 011- 2692254**<br>Fax | ඊ-මේල්<br>மின்னஞ்சல்:**dgcs@pubad.gov.lk**<br>E-mail | වෙබ් අඩවිය<br>இணையத்தளம்: **www.pubad.gov.lk**<br>Web Site |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | CS/ICTS/01/MSO-06/පොදු | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி:<br>Date | 2024.09.06 |

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පුරප්පාඩු වී පවතින තොරතුරු තාක්ෂණ සහකාර තනතුරු සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරීන් ද්විතියන පදනම මත බඳවාගැනීම**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පුරප්පාඩුව පවතින තොරතුරු තාක්ෂණ සහකාර තනතුරු සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරීන් රජයේ අවශ්‍යතාවය මත ද්විතියන පදනමින් බඳවාගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ සඳහා කැමැත්තක් දක්වන ඒකාබද්ධ සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරීන් තම ජීව දත්ත පත්‍රිකාව හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා වන ලේඛනවල සහතික කළ පිටපත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව 2024.09.30 දිනට පෙර විද්‍යුත් තැපෑලෙන් යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

03. තොරතුරු එවීමේ දී පහත කරුණු විශේෂයෙන් සැලකිල්ලට ගන්න.

(i) ජීව දත්ත පත්‍රිකාවේ පැහැදිලිව නම, ජාතික හැඳුනුම්පත් අංකය, සක්‍රිය දුරකථන අංකය සඳහන් කළ යුතු ය.

(ii) මේ සඳහා අයදුම් කළ හැක්කේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III/II/I ශ්‍රේණිවලට අයත් MT – I – 2016 යටතේ වැටුප් ලබන නිලධාරීන්ට පමණි.

(iii) පිරවීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව 07කි.

(iv) මෙහිදී ජාල පරිපාලනය, දෘඩාංග දෝෂ නිරාකරණය, මෘදුකාංග/වෙබ් අඩවි සංවර්ධනය යන ක්ෂේත්‍රවල පළපුරුද්ද ඇති නිලධාරීන් තෝරා ගැනීමට වැඩි අවධානයක් යොමු කරන අතර ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය ද සලකා බලනු ලැබේ.

(v) PDF ස්වරූපයෙන් සැකසූ අයදුම්පත යොමු කළ යුතු e-mail ලිපිනය ravisingha@trc.gov.lk වේ.

(vi) තොරතුරු විමසිය හැකි දුරකථන අංකය 011-2689345 වේ.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්